මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමෙහි දක්වා ඇති උද්ධමන ඉලක්කයෙන් මතුපිට උද්ධමනය අපගමනය වීම පිළිබඳ වාර්තාව

අදාළ කාල පරිච්ඡේදය : 2025 වසරේ තුන්වන සහ හතරවන කාර්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2026 මාර්තු මාසය

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 26(5)වන වගන්තිය සපුරාලමින්, 2025 වසරේ තුන්වන සහ හතරවන කාර්තුවල දී අනුක්‍රමික කාර්තු දෙකක් සඳහා කාර්තුමය මතුපිට උද්ධමනය මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමෙහි සඳහන් කර ඇති උද්ධමන ඉලක්කයට ප්‍රතිශතාංක දෙකක ආන්තිකයට වඩා පහළින් පැවතීම හේතුවෙන් මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් ගරු මුදල් අමාත්‍යවරයා හරහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාව.

- මෙම පිටුව හිස්ව තබා ඇත -

මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමෙහි දක්වා ඇති උද්ධමන ඉලක්කයෙන් මතුපිට උද්ධමනය අපගමනය වීම පිළිබඳ වාර්තාව

අදාළ කාල පරිච්ඡේදය: 2025 වසරේ තුන්වන සහ හතරවන කාර්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව | 2026 මාර්තු මාසය

---

1. හැඳින්වීම

1.1. *2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ (මෙතැන් සිට මහ බැංකු පනත ලෙස හැඳින්වේ) 26(1) වගන්තිය යටතේ ගරු මුදල් අමාත්‍යවරයා සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර 2023 ඔක්තෝබර් 03වන දින අත්සන් කරන ලද මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමට අනුව,[1] ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) මගින් මනිනු ලබන කාර්තුමය මතුපිට උද්ධමනය[2] 5%ක මට්ටමේ පවත්වාගෙන යෑමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවට පැවරී ඇත. තවද, මහ බැංකු පනතේ 26(5) වගන්තියට අනුව, මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමෙහි දක්වා ඇති උද්ධමන ඉලක්කය, එම ගිවිසුමෙහි දක්වා ඇති නිශ්චිත ආන්තිකයෙන් අනුක්‍රමික කාර්තු දෙකක් තුළදී සපුරා ගැනීමට මහ බැංකුව අපොහොසත් වුවහොත්, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් උද්ධමන ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට අපොහොසත් වීමට හේතු, මහ බැංකුව විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග සහ උද්ධමන ඉලක්කය සපුරා ගැනීමට ගතවන කාල සීමාව පිළිබඳ ඇස්තමේන්තුවක් සහිත වාර්තාවක් ගරු මුදල් අමාත්‍යවරයා හරහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු අතර, එය මහජනතාවට ද ලබා ගත හැකි විය යුතුය. මහ බැංකු පනතේ 26(5) වගන්තිය සඳහා අදාළ වන ආන්තිකය ප්‍රතිශතාංක ±2 බව මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමෙහි සඳහන් වේ.*

1.2. ප්‍රකාශිත දත්ත අනුව, කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනයේ කාර්තුමය සාමාන්‍යය 2025 වසරේ තුන්වන කාර්තුවේ දී 0.8%ක් සහ 2025 වසරේ හතරවන කාර්තුවේ දී 2.1%ක් ලෙස වාර්තා විය. උද්ධමනය, අනුක්‍රමික කාර්තු දෙකක් සඳහා 5%ක උද්ධමන ඉලක්කයට ප්‍රතිශතාංක 2කට වඩා පහළින් පැවති බැවින් (එනම්, 3.0%ට වඩා පහළින්), මහ බැංකු පනතේ 26(5) වගන්තිය යටතේ දක්වා ඇති අවශ්‍යතාව පරිදි මෙම වාර්තාව ඉදිරිපත් කෙරේ. 2024 වසරේ අවසාන කාර්තු තුනෙහි සහ 2025 වසරේ මුල් කාර්තු

---

[1] 2023 ඔක්තෝබර් 05 දිනැති අංක 2352/20 අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

[2] කාර්තුමය මතුපිට උද්ධමන අනුපාතිකය යනු අදාළ කාර්තුවේ මාස තුන සඳහා මාසික මතුපිට කො.පා.මි.ද. හි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස්වීම්වල සරල සාමාන්‍යය වේ.

තුනෙහි කාර්තුමය මතුපිට උද්ධමනය ඉලක්කගත මට්ටමට වඩා පහළින් පැවතීම හේතුවෙන්, මේ හා සමාන වාර්තා 2024 වසරේ දෙසැම්බර්, 2025 වසරේ මාර්තු, ජූනි, අගෝස්තු සහ දෙසැම්බර් මාසවල දී ඉදිරිපත් කෙරුණි.[3] ඒ අනුව, කාර්තුමය මතුපිට උද්ධමනය 2025 වසරේ හතරවන කාර්තුවේ දී ද උද්ධමන ඉලක්කයට වඩා පහළ අගයක පැවතීම හේතුවෙන්, මෙම වාර්තාව පෙර ඉදිරිපත් කරන ලද වාර්තාවලට අනුබැඳුමක් ලෙස ක්‍රියා කරයි.

1.3. මතුපිට උද්ධමනය අවධමන තත්ත්වයෙන් මිදී 2025 වසරේ තුන්වන කාර්තුවේ දී නැවතත් ධන අගයක් වාර්තා කළ අතර, හතරවන කාර්තුවේ දී එය ක්‍රමයෙන් ඉහළ ගියේය. කෙසේ වුවද, එය 3%ට වඩා පහළ අගයක පැවතෙමින්, උද්ධමන ඉලක්කයට වඩා පහළ දෙසින් අපගමනය වීමක් වාර්තා කරන ලදී. මෙම කාලය තුළදී උද්ධමනය කෙරෙහි දිට්වා සුළි කුණාටුව ආශ්‍රිත බාධා සීමිත බලපෑමක් ඇති කළේය. 2026 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී නිකුත් කරන ලද, උද්ධමනය පිළිබඳව දැනට පවතින නිල පුරෝකථන අනුව, ඉල්ලුම ඉහළ යෑම අර්ධ වශයෙන් හේතුවෙමින් උද්ධමනය ඉහළ යෑමේ ප්‍රවණතාව අඛණ්ඩව පවතිනු ඇතැයි පෙන්නුම් කරයි. කෙසේ වුවද, මෙම පුරෝකථන මගින් පෙන්නුම් කරන උද්ධමන ගමන්මග මීට පෙර අපේක්ෂා කළ මට්ටමට වඩා පහළ අගයක් ගන්නා අතර, අවම වශයෙන් 2026 වසරේ පළමු භාගය පුරා උද්ධමනය 3%ට වඩා අඩු මට්ටමක පැවතීමේ හැකියාව පිළිබිඹු කරයි. කෙසේ නමුත්, ඉහත පුරෝකථන නිකුත් කිරීමෙන් පසුව උද්ගත වූ එක්සත් ජනපද - ඉරාන යුදමය තත්ත්වය, ගෝලීය බලශක්ති මිල ගණන් සැලකිය යුතු ලෙස සහ තවමත් ස්ථාවර තත්ත්වයකට ළඟා වී නොමැති පරිදි ඉහළ යෑමට හේතු වී ඇති අතර එය උද්ධමනය ඉහළ යාමේ වේගය තීව්‍ර වීමට හේතු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. පවතින ගෝලීය අර්බුදයේ නිරන්තර වෙනස්වන ස්වභාවය සහ ඉන් ඇති විය හැකි සැලකිය යුතු සෘණාත්මක වක්‍ර බලපෑම් සැලකිල්ලට ගත් විට, සාර්ව ආර්ථික පුරෝකථන වත්මන් අවස්ථාවේ දී සැලකිය යුතු අන්දමින් වෙනස් වීමේ හැකියාවක් පවතී. මෙම නවතම ප්‍රවණතා සැලකූ විට, කාර්තුමය මතුපිට උද්ධමනය, 2026 වසරේ දෙවන කාර්තුවේ සිට උද්ධමන ඉලක්කයෙන් ප්‍රතිශතාංක ±2ක ආන්තිකය තුළ පැවතීමේ ඉහළ සම්භාවිතාවක් පවතින අතර, සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සහාය ඇතිව උද්ධමනය මැදි කාලීනව උද්ධමන ඉලක්කය වටා ස්ථායීව පවතිනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

---

[3] මතුපිට උද්ධමනය ඉලක්කගත උද්ධමනයෙන් අපගමනය වීම පිළිබඳ මින් පෙර ඉදිරිපත් කළ වාර්තා වෙත පහත සබැඳිය ඔස්සේ ප්‍රවේශ විය හැකිය. https://www.cbsl.gov.lk/si/මුදල්-ප්‍රතිපත්තිය/මුදල්-ප්‍රතිපත්ති-සන්නිවේදනය/පාර්ලිමේන්තුවට-වගවීම

2. උද්ධමනය ඉලක්කගත මට්ටමෙන් අපගමනය වීමට හේතු

සමස්ත ඉල්ලුම් තත්ත්වය යථා තත්ත්වයට පත්වීම මන්දගාමීව සිදු වූ තත්වයක් මධ්‍යයේ, උද්ධමනයේ මෑත කාලීන ගමන්මග කෙරෙහි සැපයුම් අංශයේ සාධක වැඩි වශයෙන් බලපා ඇත. පෙර ඉදිරිපත් කළ වාර්තාවල දක්වා ඇති පරිදි, විදුලි ගාස්තු, ඉන්ධන සහ එල්පී ගෑස් මිල ගණන් ආශ්‍රිතව සිදු කළ සංශෝධන මෙන්ම ආහාර මිල ගණන් ආශ්‍රිත වෙනස් වීම් 2024 වසරේ අවසන් කාර්තු තුනෙහි සහ 2025 වසරේ පළමු කාර්තු තුනෙහි උද්ධමන ගමන් මග කෙරෙහි බොහෝ දුරට බලපා ඇත. විනිමය අනුපාතිකයේ සිදු වූ වෙනස්වීම් ද උද්ධමනය කෙරෙහි බලපා ඇති අතර, එය ප්‍රධාන වශයෙන්ම ආනයනික මිල ගණන් සහ දේශීය පිරිවැය තත්ත්වයන් කෙරෙහි බලපෑම් ඇති කිරීම හරහා සිදු විය. මිල සංශෝධන සහ ඒවා සිදුවන කාලසීමාවන් සැලකිය යුතු ලෙස වෙනස් වීම හේතුවෙන්, විශේෂයෙන්ම විදුලි ගාස්තු ඇතුළු ඇතැම් අපේක්ෂිත මිල වෙනස් කිරීම් නිවැරදිව පුරෝකථනය කිරීම අභියෝගාත්මක වී ඇත. මීට පෙර ඉදිරිපත් කළ වාර්තා මගින් මෙම සාධක පිළිබඳව පැහැදිලි කර ඇති බැවින්, 2025 වසරේ හතරවන කාර්තුවේ දී ද උද්ධමනය ඉලක්කගත මට්ටමෙන් අඛණ්ඩව අපගමනය වීම පිළිබඳව මෙම වාර්තාව මගින් අවධානය යොමු කෙරේ.

2.1. අපේක්ෂා කළ පරිදි, මාස එකොළහක අවධමන තත්ත්වය නිමා කරමින් උද්ධමනය 2025 වසරේ තුන්වන කාර්තුවේ දී ධන අගයකට පත් වීමෙන් අනතුරුව, 2025 වසරේ හතරවන කාර්තුවේ දී අඛණ්ඩව ක්‍රමයෙන් ඉහළ ගියේය. බලශක්ති හා ප්‍රවාහන මිල ගණන් ආශ්‍රිත අවධමන පීඩන ලිහිල් වීම මෙන්ම ඇතැම් ආහාර අයිතමවල මිල ගණන් ඉහළ යෑම මෙම ප්‍රවණතාවට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, මූලික උද්ධමනය සාපේක්ෂව අඩු මට්ටමක පැවතීම සහ බලශක්ති හා ප්‍රවාහන කාණ්ඩ අඛණ්ඩ අවධමන තත්ත්වයක් වාර්තා කිරීම මධ්‍යයේ, සමස්ත මිල මට්ටම ඉහළ යෑම මන්දගාමී වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස කො.පා.මි.ද. 2025 වසරේ හතරවන කාර්තුවේ දී 2.1%ක කාර්තුමය උද්ධමන අගයක් වාර්තා කරමින් තවදුරටත් 3.0%ට වඩා අඩු අගයක පැවතුණි.

රූප සටහන 1:කාර්තුමය මතුපිට උද්ධමනය (කො.පා.මි.ද., 2021=100, වාර්ෂික ලක්ෂ්‍යමය, %)



මූලාශ්‍ර: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 2: මතුපිට සහ මූලික උද්ධමනයේ විචලනයන් (කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය, %)



මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2023 ජනවාරි මාසයට පෙර දත්ත කො.පා.මි.ද. (2013=100) මත පදනම් වන අතර, 2023 ජනවාරි මාසයේ සිට දත්ත කො.පා.මි.ද. (2021=100) මත පදනම් වේ.

රූප සටහන 3: මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (කො.පා.මි.ද., 2021=100, වාර්ෂික ලක්ෂ්‍යමය, %)



මූලාශ්‍ර: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

2.2. මේ අතර, ආර්ථිකයේ අඩු ඉල්ලුම් තත්ත්ව පිළිබිඹු කරමින්, මූලික උද්ධමනය අඩු ධන අගයක පැවතුණු අතර, 2025 වසරේ හතරවන කාර්තුවේ දී 2.4%ක අගයක් වාර්තා කළේය. 2025 වසරේ තුන්වන කාර්තුවට සාපේක්ෂව මූලික උද්ධමනය යම් ඉහළ යෑමක් වාර්තා කළ අතර, ආහාර නොවන කාණ්ඩයේ මිල ගණන්, විශේෂයෙන් 'අධ්‍යාපන' සහ 'නිවාස, ජල, විදුලි, ගෑස් සහ අනෙකුත් ඉන්ධන' කාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සැලකිය යුතු ලෙස ඉහළ යෑම සහ ආනයන ඉහළ යෑම වැනි අනෙකුත් දර්ශක මගින් ඉල්ලුම් තත්ත්ව වර්ධනය වීමක් පෙන්නුම් කළද එම මට්ටමට වඩා ඉල්ලුම ඉහළ යෑම යම්තාක් දුරකට මන්දගාමී විය හැකි බව මූලික උද්ධමනය මන්දගාමීව ඉහළ යෑම මගින් පෙන්නුම් කෙරේ. ඉදිරි කාලයේ දී මූලික උද්ධමනය ක්‍රමයෙන් ඉහළ යෑමක් අපේක්ෂා කරන අතර එය අඩු විචලනයක් සහිතව මතුපිට උද්ධමන ඉලක්කයට අනුකූල මට්ටමක ස්ථායී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, සිදුවිය හැකි බලශක්ති හා ප්‍රවාහන ආශ්‍රිත මිල ගණන් ඉහළ යෑමෙන් ඇති විය හැකි වක්‍ර බලපෑම් හේතුවෙන් මූලික උද්ධමනය ද සාපේක්ෂව වැඩි වේගයකින් ඉහළ යෑමේ හැකියාවක් පවතී.

2.3. දිගු කාලයක් පුරා ඍණ මට්ටමක පැවති බලශක්ති හා ඉන්ධන උද්ධමනය, ක්‍රමයෙන් ඉහළ යෑමක් වාර්තා කර ඇති අතර එය මතුපිට උද්ධමනය ඉහළ යෑම සඳහා හේතු වී ඇත. කෙසේ වුවද, පෙර අපේක්ෂා කළ ඇතැම් මිල ගණන් ඉහළ යෑම සිදු නොවීම හේතුවෙන් බලශක්ති

හා ඉන්ධන උද්ධමනය ඉහළ යෑම අපේක්ෂා කළ මට්ටමට වඩා මන්දගාමීව පැවතුණි. මතුපිට උද්ධමනය අවධමන මට්ටමක පැවති මෑත මාසවල දී පවා සාපේක්ෂ වශයෙන් ස්ථායීව පැවති සේවා උද්ධමනය ද මේ වනවිට ක්‍රමයෙන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. මේ අතර, මතුපිට උද්ධමනය ඉහළ යෑම සඳහා නිතර මිල උච්චාවචනය වන ආහාර උද්ධමනය දක්වන දායකත්වය මෑත මාසවල දී ස්ථායීව පැවතුණි. දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ සැපයුම් බාධා හේතුවෙන් 2025 වසරේ දෙසැම්බර් මස මුල දී ඇතැම් ආහාර අයිතමවල මිල ගණන් ඉහළ ගියද එමගින් වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් එල්ල නොවූ අතර ඒ සඳහා හිතකර සංඛ්‍යානමය පදනම් බලපෑම් මගින් මාසික ලක්ෂ්‍යමය මිල පීඩන ලිහිල් වීම හේතු විය.

2.4. 2025 වසරේ දෙවන සහ තුන්වන කාර්තුව සඳහා අදාළ වන පරිදි එම වසරේ දෙසැම්බර් මාසයේ දී නිකුත් කළ වාර්තාවේ දැක්වෙන පුරෝකථන හා සැසඳීමේ දී, 2026 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී පුරෝකථනය කළ උද්ධමන ගමන් මග සමස්තයක් ලෙස පහළ මට්ටමක පවතින අතර ඒ සඳහා ප්‍රධාන උපකල්පන කිහිපයක් ආශ්‍රිතව සිදු වූ සංශෝධන හේතු විය. මීට පෙර උපකල්පනය කර පරිදි 2026 වසරේ පළමු කාර්තුවේ දී විදුලි ගාස්තු ඉහළ දැමීමක් සිදු නොවූ අතර බලශක්ති හා ප්‍රවාහන උද්ධමනය පුරෝකථනය කළ මට්ටමට වඩා මන්දගාමීව ඉහළ ගියේය. ඊට අමතරව, මූලික උද්ධමනය ක්‍රමයෙන් ඉහළ යෑම මගින් පෙන්නුම් කෙරෙන පරිදි යටිදැරි මිල ගණන්, අපේක්ෂා කළ මට්ටමට වඩා මන්දගාමීව ඉහළ යෑම ද අඩු උද්ධමන ප්‍රවණතාව කෙරෙහි දායක වී ඇත. ගෝලීය ප්‍රවණතා පිළිබඳ උපකල්පන, Global Projections Model Network (GPMN) මගින් ලබාදෙන පුරෝකථන මත පදනම් වේ. පෙර වාර්තාවට සාපේක්ෂව, ගෝලීය නිමැවුම, ගෝලීය මූල්‍ය තත්ත්වයන්, ගෝලීය ආහාර මිල ගණන් සහ ගෝලීය ඛනිජ තෙල් මිල ගණන් සම්බන්ධ උපකල්පන ආශ්‍රිතව සිදු වූ වෙනස්කම් සමඟ ගෝලීය ඉදිරි දැක්ම සංශෝධනය විය. වෙළඳාම සම්බන්ධයෙන් පවතින ගැටලුකාරී තත්ත්වයන්, භූ දේශපාලනික අවිනිශ්චිතතා සහ මූල්‍ය තත්ත්වයන් දැඩිව පැවතීම මධ්‍යයේ වුවද ප්‍රධාන ආර්ථිකයන්හි වඩාත් ඔරොත්තු දෙන ආර්ථික ක්‍රියාකාරකම් පිළිබිඹු කරමින් ගෝලීය ආර්ථික වර්ධනය පෙර පුරෝකථනය කළ මට්ටමට වඩා ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරුණි. ගෝලීය ආහාර උද්ධමනය 2026 වසරේ දී අඩු මට්ටමක පවතිනු ඇතැයි ද 2027 වසරේ දී එය තරමක් ඉහළ මට්ටමක පවතිනු ඇතැයි ද පුරෝකථනය කර ඇත. භූ දේශපාලනික අවදානම් තවදුරටත් ඉහළ මට්ටමක පැවතිය ද සැපයුම් වර්ධනය වනු ඇති බවට පවතින අපේක්ෂා පිළිබිඹු කරමින්, ගෝලීය ඛනිජ තෙල් මිල ගණන් පෙර වාර්තාවලට සාපේක්ෂව පහළ මට්ටමකට සංශෝධන සිදු කළේය. මේ අතර, එක්සත් ජනපදයේ මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම පෙර පුරෝකථනය කළ කාලයට වඩා කඩිනම් වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, ප්‍රතිපත්ති පොලී අනුපාතික මැදි කාලීනව

අඩු මට්ටමක පවතිනු ඇතැයි එමගින් පෙන්නුම් කෙරේ. 2026 වසර සඳහා වන පරිපූරක අයවැය ඇස්තමේන්තුව මත පදනම්ව දේශීය රාජ්‍ය මූල්‍ය අංශයට අදාළ උපකල්පන ද යාවත්කාලීන කර ඇති අතර, ඒ අනුව, 2026 වසර සඳහා ඉහළ අයවැය හිඟයක් එම නවතම පුරෝකථන වෙත ඇතුළත් කර ඇත. මීට පෙර පුරෝකථනය කළ උද්ධමන ගමන් මග වෙනස් වීම කෙරෙහි උපකල්පන ආශ්‍රිතව සිදු කරන ලද මෙම සංශෝධන දායක වී ඇත.

3. මහ බැංකුව විසින් ගනු ලබන ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග

3.1. **උද්ධමනය මත ඉල්ලුම් අංශයේ පීඩන අවම කිරීම කෙරෙහි මුදල් ප්‍රතිපත්තිය අවධානය යොමු කරන අතරම සැපයුම් අංශයේ කම්පන ද සමීපව නිරීක්ෂණය කර, ඒවා උද්ධමන අපේක්ෂාවලට සැලකිය යුතු අන්දමින් බලපෑම් කරන්නේ නම් හෝ වක්‍ර බලපෑම් හරහා උද්ධමන ඉදිරි දැක්මෙහි අඛණ්ඩ වෙනස්කම්වලට හේතු වන්නේ නම් ඊට අදාළ ක්‍රියාමාර්ග මහ බැංකුව විසින් ගනු ලබයි.** කෙසේ වුවද, එවැනි දිගු කාලීන බලපෑම් දක්නට නොමැති විට, මුදල් ප්‍රතිපත්තියේ බලපෑම් ඵල දැරීමට යම් කාලයක් ගතවන හෙයින්, කෙටි කාලීන සැපයුම් අංශයේ බාධා විසඳීම සඳහා මුදල් ප්‍රතිපත්තිය යොදා ගැනීම ඵලදායී බවින් අඩු වේ.

3.2. **2023 වසරේ ජූනි මාසයේ සිට මහ බැංකුව ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කිරීමෙන් පසු, ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 2025 වසරේ මැයි මාසයේ දී පදනම් අංක 25කින් පහළ දැමීම ද ඇතුළුව, සමස්තයක් ලෙස ප්‍රතිශතාංක 8.00කින් පමණ පහළ දමා ඇත.[4]**

3.3. **2026 වසරේ ජනවාරි මාසයේ පැවති මුදල් ප්‍රතිපත්ති වාරයේ දී එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 7.75%ක මට්ටමේ තවදුරටත් පවත්වාගෙන යැමට මහ බැංකුව විසින් තීරණය කරන ලදී.** පවත්නා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අධික ඉල්ලුම් පීඩනයන් ඇති වීමට හේතු නොවී, උද්ධමනය 5%ක ඉලක්කය කරා ළඟා වීමට සහාය වනු ඇතැයි මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ අදහස විය. තවද, 2025 වසරේ හතරවන කාර්තුවේ දී 4.8%ක ආර්ථික වර්ධන වේගයක් සමඟ 2025 වසර සඳහා 5.0%ක ආර්ථික වර්ධන වේගයක් වාර්තා විය. වාණිජ බැංකු සහ වෙනත් මූල්‍ය ආයතනවලින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2025 වසර අග භාගයේ දී සැලකිය යුතු ලෙස ප්‍රසාරණය විය. තවද, ආනයන ඉහළ යැම් මධ්‍යයේ වෙළඳ ගිණුමේ හිඟය පුළුල් වුවද, 2025 වසරේ දී විදේශීය ජංගම ගිණුම සැලකිය යුතු අතිරික්තයක්

---

[4] පෙර පැවති ප්‍රවණතා හා සසඳන විට වර්තමාන ප්‍රතිපත්ති පොලී අනුපාතික පහළ මට්ටමක පවතී. තවද, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 2023 වසරේ අගෝස්තු මාසයේ දී 2% දක්වා අඩු කරන ලද අතර එතැන් සිට එය එම පහළ මට්ටමේම පවත්වාගෙන යනු ලැබීය.

වාර්තා කළ බවට ඇස්තමේන්තු කර ඇත. 2025 වසර තුළ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ හිතකර මට්ටමක පැවතුණි. වසර තුළ ඉහළ ණය සේවාකරණ ගෙවීම් මධ්‍යයේ වුවද, මහ බැංකුව විසින් ශුද්ධ පදනමින් විදේශ විනිමය මිලදී ගැනීම සහ බහුපාර්ශ්වීය ආයතනවල ලැබීම්වලින් ප්‍රධාන වශයෙන් සහාය ලබමින්, 2025 වසර අග භාගය වන විට දළ නිල සංචිත ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් බිලියන 6.8ක් දක්වා වර්ධනය විය. 2025 වසරේ දී ශ්‍රී ලංකා රුපියල, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව 5.6%කින් අවප්‍රමාණය විය.

3.4. **මෙම වාතාවරණය තුළ, ආර්ථිකයට එහි උපරිම ධාරිතා මට්ටමට ළඟා වීමට සහාය වෙමින්, උද්ධමනය එහි ඉලක්කය වටා ස්ථායී වීම සාක්ෂාත් කර ගැනීම සඳහා සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය සූදානමින් සිටී.** නිතර වෙනස්වන ගෝලීය පරිසරය සහ දේශීය අවිනිශ්චිතතා මධ්‍යයේ කිසියම් ඍණාත්මක වර්ධන බලපෑමක් ඇති වුවහොත්, ප්‍රතිපත්තිමය ලිහිල් කිරීමක් සඳහා අවකාශය පවතී. කෙසේ වෙතත්, හිතකර ණය ප්‍රසාරණය සහ සමස්ත ඉල්ලුම යථා තත්ත්වයට පත් වීම මගින් සහාය ලබමින් ආර්ථික වර්ධන වේගය අඛණ්ඩව පවතින වාතාවරණය මධ්‍යයේ, යම් ප්‍රතිපත්තිමය ලිහිල් කිරීමක් ක්‍රියාත්මක කිරීමට ප්‍රථම යම් කාල පරතරයක් සහිතව ආර්ථිකයේ ඉල්ලුම් තත්ත්වය අධික ලෙස ඉහළ යෑමට එමගින් ඇතිවිය හැකි අවදානම කෙරෙහි අවධානය යොමු කෙරෙනු ඇත. මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා තම මෙහෙයුම් කාලෝචිත සහ සුදුසු ආකාරයෙන් සිදු කරන අතර, අපේක්ෂා කළමනාකරණය කිරීම සඳහා අඛණ්ඩව ක්‍රියාශීලී සන්නිවේදන කටයුතු ද පවත්වාගෙන යනු ඇත.

4. උද්ධමන ඉලක්කය සපුරා ගනු ලබන කාල සීමාව පිළිබඳ ඇස්තමේන්තුවක්

4.1. **මේ දක්වා නිල වශයෙන් නිකුත් කරන ලද නවතම උද්ධමන පුරෝකථන, එනම් 2026 ජනවාරි මාසයේ මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන අනුව, මතුපිට උද්ධමනය ක්‍රමයෙන් ඉහළ ගොස් 2026 වසරේ දෙවන භාගයේ දී 5%ක උද්ධමන ඉලක්කයෙන් ප්‍රතිශතාංක ±2ක ආන්තිකය තුළ පවතිනු ඇතැයි අපේක්ෂා කෙරුණි.** පෙර අපේක්ෂා කළ පරිදි 2026 වසරේ ජනවාරි මාසයේ දී විදුලි ගාස්තු ඉහළ නොදැමීම, අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා අඩු අගයකින් ඉන්ධන මිල සංශෝධනය වීම, ආනයනික කිරි පිටි මිල අඩු වීම හා එහි වක්‍ර බලපෑම්, මෑත මාසවල දී මූලික උද්ධමනය සාපේක්ෂ වශයෙන් මන්දගාමීව ඉහළ යෑම මගින් පෙන්නුම් කරනු ලබන අපේක්ෂා කළ මට්ටමට වඩා අඩු වශයෙන් ඉල්ලුම් තත්ත්වයන් ඉහළ යෑම, සහ සමස්තයක් ලෙස මෑත මාසවලදී අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා අඩු මට්ටමක උද්ධමනයක් වාර්තා වීම පිළිබිඹු කරමින්, උද්ධමනය ඉහළ යෑම පෙර අපේක්ෂා කළ මට්ටමට වඩා මන්දගාමීව සිදුවනු ඇතැයි මෙම පුරෝකථනවලට අනුව අපේක්ෂා කෙරිණි. ඉහත පුරෝකථන වාරය තුළ පුරෝකථනය කරන ලද කාර්තුමය මතුපිට උද්ධමනයේ ගමන්මග

රූප සටහන 4හි උද්ධමන ව්‍යාප්ති සටහන මගින් දක්වා ඇත. ආර්ථික පුරෝකථන, උපකල්පන සහ විනිශ්චයන් මත පදනම්ව සිදු කරන බැවින්, ස්වභාවයෙන්ම ඒ හා සබැඳි අවිනිශ්චිතතා පවතින අතර, ව්‍යාප්ති සටහන මගින් මෙම අවිනිශ්චිතතා නිරූපණය කරනු ලබයි. ඉහත සාකච්ඡා කළ පරිදි මතුපිට උද්ධමනය 3-7% පරාසයෙහි පවතිනු ඇතැයි කළ තක්සේරුව, පුරෝකථන ව්‍යාප්තියේ මධ්‍යන්‍යය ගමන් මග මත පදනම් වේ. මේ අතර, ව්‍යාප්ති සටහන මගින් දැක්වෙන පුරෝකථන ව්‍යාප්තිය මත පදනම් වූ විට 2026 වසරේ දෙවන භාගය වන විට උද්ධමනය 3–7% පරාසයේ පැවතීමට ඇති සම්භාවිතාව අඩුම වශයෙන් 37%ක් පමණ වන බව ඇස්තමේන්තු කර ඇත. ආර්ථිකය යථා තත්ත්වයට පත් වෙමින් පැවතීම, මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම, ශ්‍රී ලංකා රුපියල ක්‍රමයෙන් අවප්‍රමාණය වීම, සහ බලශක්ති හා ප්‍රවාහන අංශයේ අවධමනය ක්‍රමයෙන් පහව යෑමේ අපේක්ෂා යනාදිය හේතුවෙන් මතුපිට උද්ධමනය ඉලක්කගත මට්ටම කරා ක්‍රමයෙන් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරිණි. සාමාන්‍යයෙන් ආර්ථිකයේ යටිදැරි උද්ධමනය මනිනු ලබන මූලික උද්ධමනය, මැදි කාලීනව අඩු විචලනයක් සහිතව මතුපිට උද්ධමන ඉලක්කයට අනුකූල මට්ටමක් කරා ක්‍රමයෙන් ඉහළ ගොස්, සාපේක්ෂව ස්ථායී මට්ටමක පවතිනු ඇතැයි ද අපේක්ෂා කෙරිණි.

4.2. **ඉහත සඳහන් කළ උද්ධමනය එහි ඉලක්කයට ආසන්න මට්ටම් කරා ළඟා වීමට ගත වන කාල සීමාව, 2026 ජනවාරි මාසයේ සිදු කළ පුරෝකථන වාරයේ දී පැවැති දත්ත, උපකල්පන සහ විනිශ්චයන් මත පදනම් වේ.** මෙම පුරෝකථන ගෝලීය බලශක්ති හා ආහාර මිල පිළිබඳ වන පුරෝකථන, ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ අපේක්ෂිත ආර්ථික වර්ධනය, රජයේ අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඉදිරි දැක්ම, එක්සත් ජනපද මුදල් ප්‍රතිපත්ති පොලි අනුපාතිකය මගින් නිරූපණය වන ගෝලීය මූල්‍ය තත්ත්ව සහ විදේශීය ජංගම ගිණුමේ ශේෂය ඇතුළුව විදේශීය අංශයේ අපේක්ෂිත ප්‍රවණතා යනාදී කරුණු මත රඳා පවතී. එබැවින් මෙම උපකල්පන වල සිදු වන සැලකිය යුතු මට්ටමේ වෙනසක් සැබෑ උද්ධමනය පුරෝකථනය කළ මාර්ගයෙන් අපගමය වීමට හේතු විය හැකිය. විශේෂයෙන්ම මෑත කාලීන ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන්වල සිදු වූ වෙනස් වීම් පුරෝකථනය කළ උද්ධමන පථයෙහි සැලකිය යුතු මට්ටමේ වෙනසක් සිදු වීම සඳහා හේතු විය හැකිය.

4.3. **උද්ධමන ප්‍රවණතා ඉහත අයුරින් පුරෝකථනය කර පැවතිය ද, ඇමරිකා එක්සත් ජනපද-ඉරාන යුද්ධයට අදාළ මෑත කාලීන ප්‍රවණතා, මිල ගණන් මත, විශේෂයෙන් බලශක්ති හා ඉන්ධන මිල ගණන් මත සැලකිය යුතු ඉහළ පීඩන ඇති කළ අතර, එමගින් 2026 වසරේ දෙවන කාර්තුව වන විට උද්ධමන ඉලක්කයෙන් ප්‍රතිශතාංක ±2ක සීමාව තුළ මතුපිට උද්ධමනය පැවතීමේ ඉහළ හැකියාවක් පවතී.**

4.4. මැද පෙරදිග අර්බුදය ආශ්‍රිත නවතම ගෝලීය වර්ධනයන් සැලකිල්ලට ගනිමින්, උද්ධමන පුරෝකථන පථයෙහි සැලකිය යුතු වෙනස් වීමක් අවශ්‍ය වේ. මෙම තත්ත්වයට ප්‍රතිචාර ලෙස යම් මිල වැඩිවීම් දැනටම සිදු වී ඇත. වෙනස්වන තත්ත්වයන් මත පදනම්ව, විශේෂයෙන් බලශක්ති හා ඉන්ධන මිල ගණන්හි තවදුරටත් සංශෝධන සහ ඒවායේ වක්‍ර බලපෑම් සිදුවනු ඇතැයි අපේක්ෂා කළ හැකිය. ඒ අනුව, 2026 වසරේ ජනවාරි පුරෝකථනයන්හි අපේක්ෂා කළ මට්ටමට වඩා වේගවත් ලෙස උද්ධමනය ඉහළ යෑමේ වැඩි හැකියාවක් පවතින අතර, බොහෝ දුරට 2026 වසරේ දෙවන කාර්තුව වනවිට උද්ධමනය, එහි ඉලක්කයේ සිට ප්‍රතිශතාංක ±2ක පරාසය තුළ පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

4.5. ඒ අනුව, සාධක කිහිපයක් හේතුවෙන් වාර්තා වන උද්ධමනය, උද්ධමන පුරෝකථන වලට වඩා ඉහළ යෑමේ අවදානම් පවතී. විශේෂයෙන්ම, මෑත කාලීනව එක්සත් ජනපද-ඉරාන යුද්ධය උත්සන්න වීමත් සමඟ, මැද පෙරදිග කලාපයේ වර්ධනය වී ඇති භූ දේශපාලනික නොසන්සුන්තාවන්, ගෝලීය අවිනිශ්චිතතාව සැලකිය යුතු ලෙස ඉහළ නංවා ඇති අතර එමගින් ඛනිජ තෙල්, වෙළඳ භාණ්ඩ, නැව්ගත කිරීම් සහ මූල්‍ය වෙළඳපොළවල් සඳහා දැඩි බාධාවන් පමුණුවා ඇත. මෙම ප්‍රවණතාවන්හි පවතින වෙනස්වන ස්වභාවය අනුව, වත්මන් ගෝලීය ආර්ථික පරිසරය ඉහළ අවිනිශ්චිතතාවයකින් යුක්ත වේ. මෙම ප්‍රවණතාවන් හේතුවෙන් දැනටමත් ගෝලීය ඛනිජ තෙල් මිල ගණන් සහ නැව්ගත කිරීමේ පිරිවැය ඉහළ යෑමට හේතු වී ඇති අතර, එය දේශීය බලශක්ති හා ප්‍රවාහන මිල ගණන් ඉහළ යෑමට ද බලපෑ ඇත. ඇති විය හැකි සැපයුම් බාධා සහ අවශ්‍ය පූර්වාරක්ෂණ ක්‍රියාමාර්ග හේතුවෙන් හදිසි ඉල්ලුම් පීඩන සහ දේශීය මිල ගණන් කෙරෙහි වන වක්‍ර බලපෑම් ඇති විය හැකිය. ඊට අමතරව, ශ්‍රී ලංකා රුපියල ඉහළ මට්ටම්වලින් අවප්‍රමාණය වීමට ඇති හැකියාව, ඉහළ ණය වර්ධනයේ පසු බලපෑම හේතුවෙන් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා ඉහළ ඉල්ලුම් පීඩන ඇති වීමේ හැකියාව, සහ කෘෂිකාර්මික නිෂ්පාදනයට සහ ආහාර මිල ගණන්වලට අහිතකර ලෙස බලපෑ හැකි පොහොර ඇතුළු කෘෂිකාර්මික යෙදවුම්වල පිරිවැය ඉහළ යෑම මෙන්ම කෘෂිකර්මාන්තය සහ බලශක්ති අංශවලට බලපෑම් සිදුවන අහිතකර කාලගුණික තත්ත්වයන් ඇතිවීමේ හැකියාව ද උද්ධමනය මත තවදුරටත් ඉහළ පීඩන ඇති කළ හැකිය. මේ අතර, දිට්වා සුළි කුණාටුව ආශ්‍රිතව සිදු වූ බාධාවන්ගෙන් පසුව නැවත වගා කිරීමේ කටයුතු වඩාත් යහපත් ලෙස අඛණ්ඩව සිදු වීම සහ ඒවායේ හිතකර බලපෑම් මගින් කෘෂිකාර්මික නිෂ්පාදනයට සහාය වීම සහ එමගින් ආහාර මිල පීඩන ලිහිල් වීමට ඇති හැකියාව, වාර්තා වන උද්ධමනය, උද්ධමන පුරෝකථන වලට වඩා පහළ යෑමේ අවදානම් ලෙස සැලකේ. මැද පෙරදිග කලාපයේ පවතින අර්බුදයේ නිරන්තර වෙනස්වන ස්වභාවය හේතුවෙන් මිල ගණන් සහ ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි ඇති බලපෑම තවමත් ඉතා අවිනිශ්චිතව පවතී. එවැනි වෙනස්වන ආර්ථික තත්ත්වයන් ඉදිරි කාලයේ දී මුදල් ප්‍රතිපත්තිය තීරණය කිරීමේ දී මුදල්

ප්‍රතිපත්ති මණ්ඩලය විසින් දැඩි අවධානයට ලක් කරනු ඇත. මේ අතර, ලැබෙන තොරතුරුවලට අනුකූලව මහ බැංකුවේ උද්ධමන පුරෝකථන මනා ලෙස සකස් කර මුදල් ප්‍රතිපත්ති ආශ්‍රිත සන්නිවේදන මාර්ග හරහා මහජනතාවට සන්නිවේදනය කෙරෙණු ඇත.

රූප සටහන 4: මතුපිට උද්ධමනයේ පුරෝකථන (කාර්තුමය, කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය, %)

2026 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව



මූලය; මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

§ 2023 වසරේ ඔක්තෝබර් මාසයේ දී මහ බැංකුව සහ මුදල් අමාත්‍යවරයා අතර අත්සන් කරන ලද මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුම යටතේ උද්ධමන ඉලක්කය (5%) සඳහා එකඟ වී ඇත.

* උද්ධමන ව්‍යාප්ති සටහනෙහි වාර්තා කරන ලද දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2021=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද) මත පදනම් වේ. 2026 ජනවාරි මස පුරෝකථන වාරයේ දී පැවති සියලුම ප්‍රකාශිත දත්ත මත පුරෝකථනය පදනම් වේ.

සටහන: පුරෝකථනයක් යනු පොරොන්දුවක් හෝ බැඳීමක් නොවේ.

උද්ධමන ව්‍යාප්ති සටහන මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්‍රම්භ පරාස භාවිත කිරීමෙන් විදහා දැක්වේ. රූප සටහනෙන් දැක්වෙන විශ්‍රම්භ ප්‍රාන්තර (confidence intervals, CI) මගින් මැදි කාලීන උද්දමනය විචලනය විය හැකි අගය පරාසයන් දක්වයි. උදාහරණයක් ලෙස, තද කොළ පැහැති ප්‍රදේශය සියයට 50 විශ්‍රම්භ ප්‍රාන්තරය නිරූපණය කරන අතර, එමගින් උද්ධමනයේ සැබෑ අගය මෙම පරාසය තුළ පැවතීමේ සියයට 50ක සම්භාවිතාවක් පවතින බව හඟවනු ලබයි. විශ්‍රම්භ පරාසයන් මගින් උද්ධමනය දීර්ඝ කාලයකට පුරෝකථනය කිරීමේ දී ඇතිවිය හැකි අවිනිශ්චිතතාවයේ ඉහළ යෑම පෙන්නුම් කරයි.

ඉහත පුරෝකථන එක්සත් ජනපද-ඉරාන යුද ගැටුමට පෙරාතුව සකස් කෙරුණි. ඒ අනුව, ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ඉහළ යෑම සහ එහි පුළුල් බලපෑම් මෙහි සඳහන් මැදි කාලීන පුරෝකථනවලින් තවමත් පෙන්නුම් නොකරයි.

රූප සටහන 5: කාණ්ඩ අනුව මතුපිට උද්ධමනය (කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය, %)



මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: 2023 ජනවාරි මාසයට පෙර පැවති දත්ත කො.පා.මි.ද.(2013=100), මත පදනම් වන අතර, 2023 ජනවාරි මාසයේ සිට ආරම්භ වන දත්ත කො.පා.මි.ද. (2021=100) මත පදනම් වේ. කො.පා.මි.ද. (2021=100) මත පදනම්ව, වරහන් තුළ පදනම් වර්ෂයේ බර තැබීම සඳහන් කර ඇත.